// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1924/4 - 2015 ජූලි මස 20 වැනි සඳුදා - 2015.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 10/3/1/3/54.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2012/WS/306.

"උඩතැන්න ජල සම්පාදන ක්‍රමයේ නිෂ්පාදිත නළ ළිං ඉදිකිරීම සඳහා" පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, වරාපිටිය ග්‍රාම නිලධාරි වසමේ, වරාපිටිය ගමේ පිහිටි මාතලේ ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් සහතික කරන ලද මා 1644 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම් කට්ටිය.

කැබලි අංකය 01

ඉඩමේ නම: තැඹිලිපොළහේන *නොහොත්* වත්ත, තැඹිලිපොළහේන වත්ත; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: ක්ලේරා මුණසිංහ සිරිවර්ධන මිය, කටුදෙනිය, වරාපිටිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1317.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 සැප්තැම්බර් මස 16 වැනි දින පෙ. ව. 10.00ට රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2015 සැප්තැම්බර් මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එම ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, ඉල්ලුම් කරන වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

බී. එම්. ජී. බී. විජේබණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්.
රත්තොට.

2015 ජූලි මස 16 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 40

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 21962 - 14 - (2015/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.